පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : : චිත්‍ර කලාව

සතිය : අටවන සතිය

සකස් කිරීම : D.P.එපිටවත්ත මිය

මාවනැල්ල අධ්‍යාපන කලාපය


ශ්‍රේණිය : 6

**නිපුණතාව 1.0 : පරිසරය ආශ්‍රිත තේමා යටතේ චිත්‍ර සංරචනය කරයි.**

- නිපුණතාව 4.0 : නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් චිත්‍ර නිර්මාණ කරයි.
- නිපුණතා මට්ටම 4.2 : ව්‍යවහාරික හා සන්නිවේදන අවශ්‍යතා සඳහා සිදුරු තහඩු මුද්‍රණ ක්‍රමය භාවිත කරයි.
- ක්‍රියාකාරකම 4.2.1 : ක්‍රීඩා උත්සවයක් සඳහා ආරාධනා පත්‍රයක් නිර්මාණය කිරීම.
- කාලච්ඡේද සංඛ්‍යාව : 03 යි.
- සපයාගතයුතු ද්‍රව්‍යයන් :
- බ්‍රිස්ටල් බෝර්ඩ් හා සුදුසු ඝනකම් කඩදාසි
- පෝස්ටර් සායම්, ෆැබ්රික් සායම්
- කෙඳි සිරස්ව ඇති දත් බුරුසුවක්, හිස පීරන පනාවක්
- පේපර් කටර්, ඇමුණුම් කටු, පින්සල් හා ජ්‍යාමිතික උපකරණ
- වර්ණ ,ඩ්‍රොවින් කඩදාසි පැන්සල් 2B/ 4B වර්ගයේ පැන්සල් ,චිත්‍ර අඳින කඩදාසි ,චිත්‍ර ඇඳීමේ පුවරු

## ක්‍රියාකාරකම

- විවිධ ආරාධනා පත්‍ර හොඳින් නිරීක්ෂණය කරන්න.
- අවශ්‍යතාවට ගැළපෙන ලෙස රූප සටහන්, සංකේත හා අක්ෂර යොදා ඇති ආකාරය අවබෝධ කරගන්න.
- ඝනකම් ඩ්‍රොවින් කඩදාසිය මත ඔබ නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන ආරාධනා පත්‍රයේ ඉදිරිපස හා පසුපස ද සටහන් කර සුදුසු ප්‍රමාණයට සීමා/රේඛා ඇඳ සැලසුම් කරන්න.
- එම නිර්මාණයට බ්‍රිස්ටල් බෝර්ඩ් එක හා දළ රේඛා සටහන් ඇඳීමට භාවිත කරන කඩදාසිය මත සීමා/රේඛා ඇඳ සලකුණු කරන්න.
- ක්‍රීඩා උත්සවයකට ගැළපෙන පරිදි, රූප හැඩතල, සංකේත හා වැකි යොදා දළ රේඛා චිත්‍රය අඳින්න.
- බ්‍රිස්ටල් බෝර්ඩ් එක කපා ඉවත් කර එය මත දළ රේඛා සටහන තබා අවශ්‍ය රූප හා සංකේත පිටපත් කරන්න. (සිදුරු තහඩු මුද්‍රණය සඳහා සටහන් අඳින විට හැඩතල වෙන් නොවන සේ කපා ගැනීමට හැකිවන පරිදි ආධාරක තීරු සහිතව රූප සටහන් අඳින්න ඝනකම් කඩදාසි .ඒ සඳහා දළ සටහන් හා නිදර්ශන චිත්‍ර භාවිතා කරන්න ඒවා නිර්මාණය කර උචිත වර්ණ ගන්වන්න.


ආරාධනා!
ශ්‍රී වශාන්තර ක්‍රීඩා
2020